**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**
**இலங்கைச் சட்டத்தரணிகள் சங்கம்**
**BAR ASSOCIATION OF SRI LANKA**

2021 නොවැම්බර් 26

**<u>සිංහල පරිවර්තනය</u>**

## ප්‍රකාශය : පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවකු මරාදැමීම

2021 නොවැම්බර් 25දා රාත්‍රියේ නීතිඥ සංජය ආරියදාස මහතා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා අමතමින් දැනුම් දුන්නේ එච්.එල්. ලසන්ත හෙවත් ටිංකරිං ලසන්ත නම් වන ඔහුගේ සේවාදායකයකු කළුතර කොට්ඨාසයේ පොලිස් අපරාධ විමර්ශන කාර්යාංශය විසින් අත්අඩංගුවට ගෙන ඇති බව හා ආයුධ අත්අඩංගුවට ගැනීමට ගිය විටදී ඇති වන වෙඩි හුවමාරුවකින් මියගිය බවට ඇඟවෙන පරිදි පොලිසිය විසින් තම සේවාදායකයා ඝාතනය කිරීමට සැලැස්මක් ඇති බවට තොරතුරු ඔහුට ලැබී ඇති බවයි.

ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා වහාම මේ පිළිබඳව පොලිස්පතිවරයාට ඊමේල් මගින් හා කෙටි පණිවුඩයක් මගින් දැනුම් දුන්නේය. සභාපතිවරයා විසින් මේ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලි හා විමර්ශන භාර කොමසාරිස් වෙත ද, කොමිෂන් සභාවේ පැමිණිලි හා විමර්ශන අධ්‍යක්ෂ වෙත ද දැනුම්දෙන ලදී. අමතර ක්‍රියාමාර්ගයක් ලෙස ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා විසින් මේ පිළිබඳ උතුරු පළාත් ආණ්ඩුකාර ජීවන් ත්‍යාගරාජා මහතා වෙත ද දැනුම් දෙන ලදී. මානුෂීය නියෝජිතායතන සාමූහිකයේ (CHA) ප්‍රධානී ධුරය දරන්නේ ඒ මහතාය. තමන් විසින් බලධාරීන් සම්බන්ධ කරගෙන මෙම පැමිණිල්ල පිළිබඳ දැනුම් දුන් බව ද, සැකකරුගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මැදිහත් වන ලෙස ඉල්ලා සිටි බව ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා ත්‍යාගරාජා මහතා විසින් තහවුරු කර ඇත.

කෙසේ වෙතත්, නොවැම්බර් 26 දින මාධ්‍ය විසින් වාර්තා කරනු ලැබුවේ සැකකරු ආයුධ අත්අඩංගුවට ගැනීමට ගිය විටදී වෙඩිවැදී මියගිය බවයි. නැවත වතාවක්, ශ්‍රී ලංකා පොලිසිය නීති විරෝධී ඝාතනයක් සමග සම්බන්ධව ඇත. මෙම ඝාතනය සිදුවන්නේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්ව වාර්තාව පරීක්ෂාවට ලක්වෙමින් තිබෙන වකවානුවකය. බිඳවැටෙමින් තිබෙන මානව හිමිකම් තත්ත්වය රටටත්, ආර්ථිකයටත් තර්ජනාත්මක ප්‍රතිඵල නිර්මාණය කිරීමට ඉඩඇති පසුබිමක් තුළය.

ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකා නීතිඥ සංගමය පමණක් නොව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා විධායකයේ ජ්‍යෝෂ්ඨ පුද්ගලයකු ද පොලිසිය සම්බන්ධ කරගෙන මෙම දරුණු අපරාධය වැළැක්වීමට උත්සාහ කර තිබේ. මෙම ඝාතනය සිදුවන්නේ එවැනි මැදිහත්වීම් පවා තිබියදී වීම දැඩි අවධානයට ලක්විය යුතු තත්වයකි. රාජ්‍ය අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කළ යුතු බවට රටේ ඉහළම අධිකරණය විසින් දෙන ලද්දා වූ තීන්දු කෙරෙහි කිසිදු සැලකිල්ලක් නොදක්වමින් පොලිසිය දිගටම කටයුතු කරන බව පෙනෙන්නට තිබේ.

මීට පෙර සිදුවූ මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් ද නිසි පරිදි විමර්ශන සිදුකර නොමැති බව ද, බලධාරීන් විසින් වගඋත්තරකරුවන් යුක්තිය හමුවට පැමිණවීම සඳහා ක්‍රියාමාර්ග නොගත් බව ද, එමගින්



| President | Deputy President | Secretary | Treasurer | Assistant Secretary |
|---|---|---|---|---|
| Saliya Pieris PC | Anura Meddegoda PC | Rajeev Amarasuriya | Rajindh Perera | Pasindu Silva |

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2448090 E-mail: basl.lawnet@gmail.com Web: www.basl.lk

දණ්ඩමුක්තිය සහිත පරිසරයක් පිළිබඳ චෝදනාවක් නිර්මාණය වන බව ද ශ්‍රී ලංකා නීතිඥ සංගමය පෙන්වාදෙයි. එවැනි අසාර්ථකත්වයන් හේතුවෙන් යුක්තිය පසිඳලීමේ සමස්ත ක්‍රියාවලියම ප්‍රශ්නකාරී තත්වයකට පත්වන අතර, එහි කාර්යක්ෂමතාව පිළිබඳ මහජන විශ්වාසය ගිලිහී යයි.

මෙම ඝාතනවල වගකීම එම ඝාතන සිදුකළ පුද්ගලයන් වෙත පමණක් නොව එම ඝාතන සඳහා නියෝග නිකුත් කළ පුද්ගලයන් සහ සැකකරුගේ ආරක්ෂාව සහතික කිරීමට අසමත් වූ පුද්ගලයන් වෙත ද යොමුවිය යුතුය. එසේම පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවකුගේ ආරක්ෂාව සැලැස්වීමට අසමත් වීම පිළිබඳවද පොලිස්පතිවරයා කරුණු පැහැදිලි කළ යුතු බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඉල්ලා සිටියි.

මෙම කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය වැඩිදුරටත් කටයුතු කරනු ඇති අතර එම කටයුතු පිළිබඳ සංගමයේ සාමාජිකත්වය හා පොදු ජනතාව දැනුවත් කරනු ඇත.

අත්සන් කළේ

**රජීව් අමරසූරිය**
**ලේකම්**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**



**President** Saliya Pieris PC | **Deputy President** Anura Meddegoda PC | **Secretary** Rajeev Amarasuriya | **Treasurer** Rajindh Perera | **Assistant Secretary** Pasindu Silva

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2448090 E-mail: basl.lawnet@gmail.com Web: www.basl.lk